එක්සත් ජාතික පක්ෂ සභාපති, හිටපු අමාත්‍ය වජිර අබේවර්ධන මහතා අද (26) කොළඹ මල් පාර දේශපාලන කාර්යාලයේ පැවැති ඒකාබද්ධ විපක්ෂයේ මාධ්‍ය සාකච්ඡාවේදී දැක් වූ අදහස්.

අවබෝධයකින් තොර රාජ්‍ය පාලනයෙන් සිදු වී ඇත්තේ ශ්‍රී ලංකාව ලෝකයා ඉදිරියේ හැල්ලුවට ලක් වීමයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වෙනි වගන්තිය, 149 වෙනි වගන්තිය, 150 වෙනි වගන්තිය, 151 වෙනි වගන්තිය සහ 152 වෙනි යන වගන්ති යටතේ සම්පූර්ණ මූල්‍ය වගකීම තිබෙන්නේ පාර්ලිමේන්තුව සතුවයි.

මෙසේ රටේ මුදල් බලය සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තුව සතු වී තිබෙන අවස්ථාවකත් එනම්, 2022 අප්‍රේල් මස 12 වෙනිදා අපේ රට බංකොලොත් කියා ප්‍රකාශ කළා. එම අවස්ථාවේ සිදුවූයේද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා උල්ලංඝනයකි. එසේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වූ මොහොතක පවා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා විසින් මූල්‍ය විනය ශක්තිමත් කිරීම සඳහා පියවර ගත්තා.

උදාහරණයක් ලෙස අනාගතයේදීද රට බංකොලොත් යැයි නිවේදනය කිරීමට නොහැකි වන පරිදි ; එක් පැත්තකින් මහ බැංකු පනතත්, එමෙන්ම 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ පනතත් 2024 ජුනි මස 18 වෙනි දින කථානායකවරයා විසින් අත්සන් කොට මූල්‍ය ශක්තිමත් කිරීම සඳහා පියවර ගත්තා.

එම මූල්‍ය පනත් අනුව ඉතාමත් ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් රට තුළ ඇති කර තිබුණත්, එම පනතේ සඳහන් නීතිරීති පිළිබඳ වර්තමාන පාලන යන්ත්‍රයට නිසි අවබෝධයක් නොමැතිකම නිසා අපේ රටේ මහා භාණ්ඩාගාරය විසින් මේ මූල්‍ය විනය විනාශ කිරීම සිදු කර තිබෙනවා. මෙය අපේ රට ලෝකය ඉදිරියේ මහත් ලැජ්ජාවට පත් වූ අවස්ථාවක්.

රාජ්‍ය කළමනාකරණ පනත සකස් කළේ මූල්‍ය ආරක්ෂාව තවදුරටත් තහවුරු කිරීම සඳහාය. නමුත් 2024 සැප්තැම්බර් 21 වෙනි දින වන විට තිබුණු පාලන යන්ත්‍රයේ බලය අහිමි වන අවස්ථාවේ, එම පනත ක්‍රියාවට නැංවීමට පනතේ සඳහන් කර තිබුණේ මාස හයක කාලයක් තුළ එය ශක්තිමත් කිරීම සඳහා පියවර ගත යුතු බවයි.

අංක 33 දරණ රාජ්‍ය ණය කළමනාකාරණ පනතේ 8 (1) වගන්තියේ සඳහන් වූයේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීමයි.

එනම්,

(අ) සභාපතිවරයා වශයෙන් කටයුතු කළ යුතු භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගෙන්;

(ආ) භාණ්ඩාගාරයේ භාණ්ඩාගාර මෙහෙයුම් විෂය භාර දෙපාතර්මේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්;

(ඇ) භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රතිපත්ති විෂය භාර දෙපාතර්මේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්;

(ඈ) භාණ්ඩාගාරයේ විදේශ සම්පත් විෂය භාර දෙපාතර්මේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්;

(ඉ) භාණ්ඩාගාරයේ ජාතික අයවැය විෂය භාර දෙපාතර්මේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්;

(ඊ) භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය විෂය භාර දෙපාතර්මේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්;

(උ) මහ බැංකු අධිපතිවරයා විසින් නම් කරනු ලබන, අධ්‍යක්ෂවරයෙකුගේ නිලයට නොඅඩු නිලයක් දරන මහ බැංකුවේ නිලධාරීන් දෙදෙනෙකුගෙන්; සහ

(ඌ) කායර්ාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්, සමන්විත (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුවක් විය යුතු ය.

(2) කායර්ාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, කමිටුවේ ලේකම්වරයා සහ කැඳවුම්කරු ලෙස කටයුතු කිරීම සඳහා, කායර්ාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු නම් කරනු ලැබිය යුතු ය.

(3) කමිටුව, යටත් පිරිසෙයින්, සෑම මාසයකට ම එක් වරක්වත් රැස්විය යුතු ය.

9. කමිටුවේ බලතල, කායර් සහ කතර්ව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) ණය කළමනාකරණ උපායමාගර්ය සාවර් ආථර්ික ප්‍රතිපත්තිවලට අනුකූල බවට සහතික කර ගනිමින් කායර්ාලය විසින් පිළියෙල කරනු ලබන ණය කළමනාකරණ උපායමාගර්ය සහ එහි යාවත්කාලීන කිරීම් සමාලෝචනය කොට, ඒ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීම;

(ආ) වාෂර්ික ණය ගැනීමේ සැලැස්ම සහ එහි කායර්සාධනය සමාලෝචනය කොට, ඒ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීම;

(ඇ) දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොළ තත්ත්වයන් සමාලෝචනය කොට, රාජ්‍ය ණය හා සම්බන්ධ වූ අවදානම් පිළිබඳව සහ වෙළඳපොළේ ඇති අවස්ථා සහ නිල සංවධර්න සහයෝගිතාව පිළිබඳ නිදෙර්ශ ලබා දීම; සහ

(ඈ) 3 වන වගන්තිය යටතේ වූ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කායර්ය සඳහා අමාත්‍යවරයා විසින් කමිටුව වෙත පවරනු ලැබිය හැකි වෙනත් කතර්ව්‍ය ඉටු කිරීම.

10. (1) කමිටුවේ ගණපූණර්ය, සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන් විය යුතු ය.

ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යාංශය හැක් වී ඇත.

ඉහත සඳහන් කළමනාකාරිත්වය ඇති කළේ ණය ගැනීම්, ණය ගෙවීම් නීත්‍යානුකූලව ඉටු කිරීම සඳහායි. කෙසේ හෝ දැනට විවිධ අංශ මඟින්, හැකවර්රුන් විසින් මෙය සිදු කරා යැයි සටහන් කළත්, දැනට හැකර් වී ඇත්තේ ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යාංශයයි. හැකවර්රයෙක් කාගේ හරි ගිණුමකට හොරෙන් ඇවිත් සල්ලි හොරකම් කරගෙන යාම ඒ හැකගෙර් තිබෙන වංචනික හැකියාවයි.

නමුත් මෙම වංචනික ක්‍රියාව තුළ හැකර් වී ඇත්තේ ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යාංශයයි. මක් නිසාද යත් මුදල් අමාත්‍යාංශයට ගෙවීමක් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාගර් පිළිබඳ නිසි අවබෝධයක් නොතිබීමයි.

අනිවාර්යයෙන්ම හැකර් ලෙස කටයුතු කර තිබෙන්නේ මුදල් අමාත්‍යාංශයයි, අනිත් පාශර්වය කුමක්ද යන්න වෙනම සොයා බැලිය යුතුව තිබෙනවා.

රජයේ මුදල් යනු ඒවා මොන අමාත්‍යාංශයේ තිබුණත්, ඒවා මොන රජයේ ගිණුම්වල තිබුණත් මහජනයාගේ මුදල්ය. මහජනයා කලින් කලට රජයන් පත් කරනු ලබන්නේ මෙම මුදල් සහ මුදල් වැය කරමින් ලබා ගෙන ඇති සම්පත් නිසි පරිදි කළමණාකරනය කරගෙන පරීක්ෂාකාරීව නිසි සුපරීක්ෂණයෙන් කටයුතු කිරිම සඳහායි. මෙහිදී මුදල් යන විශය ඉතා වැදගත් වේ.

රජයේ මුදල් හුවමාරු කරනු ලබන සහ වගකීම දරනු ලබන ප්‍රධාන ස්ථානයක් වන්නේ ආයතනයක් වශයෙන් ගත් කළ මුදල් අමාත්‍යාංශයයි. නැතහොත් මහා භාණ්ඩාගාරයයි. එවිට අදාළ ආයතනය විසින් හුවමාරු කරනු ලබන්නේ මහජනතාවගේ මුදල් බැවින් ඒවා ආරක්ෂා කිරිමට පත් කර ඇති මුදල් ලේකම්වරයා සහ මහාභාණ්ඩාගාරයේ ලේකම්වරයා ඇතුළු සියලු නිලධාරීන් නිසි අවධානයෙන් යුතුව විවිධ චක්‍රලේඛන හා විවිධ රෙගුලාසිවල දක්වා ඇති ආකාරයට කටයුතු කළ යුතුය.

මෙය මුදල් ලේකම්වරයා හා විවිධ නිලධාරීන්ට පමණක් නොව සියලුම රාජ්‍ය සේවකයන්ට පොදු වූ කාරණයකි. ඒ අනුව සියලුම රාජ්‍ය නිලධාරින්ගේ ප්‍රධාන වගකීම වන්නේ මහජනයාට අයිති මුදල් මහජනයා වෙනුවෙන් නිසි පරිදි ඉතා සුපරීක්ෂාකාරීව කළමනාකරණය කිරීමයි.

ඒ නිසාම තමයි රාජ්‍ය සේවකයා මහජන සේවකයෙක් හැටියට සළකනු ලබන්නේ. මෙම තත්ත්වය යටතේ කිසිදු රාජ්‍ය නිළධාරියෙකුට හිතූ මනාපෙට කටයුතු කිරීමට හැකියාවක් නැහැ. රජයේ මුදල් ‘‘දෙවියන්ගේ හාල්’’ සේ සළකා කටයුතු කළ යුතුව ඇත. අප සියලුදෙනා දන්නා කාරණයක් වන්නේ දෙවියන්ගේ හාල් කෑ විට නැවත ඒවා පල දෙන බවයි. අපිට පෙනෙන ආකාරයට අද මුදල් අමාත්‍යාංශය තුළ ඇති වී ඇත්තේ එවැනි තත්ත්වයක්.

රජයේ මුදල් පරිපාලනය සම්බන්ධයෙන් ඉතාම වැදගත් ලේඛනයක් වන්නේ පාලරීමේන්තුව විසින් අනුමත කර දී ඇති මුදල් රෙගුලාසි වේ. මෙම මුදල් රෙගුලාසි කොතරම් වැදගත්ද යන්න එහි ඇති අන්තගර්තයෙන් පැහැදිළිව පෙනේ. එසේම ඊට අමතරව විවිධ චක්‍රලේඛනද වරින් වර ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම මුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අදාළ සැපයුම්කරුවන් හෝ මුදල් ගෙවීමට අදාළ පාශර්වකරුවන් සමග ගිවිසුම්වලට එළඹීම, එම ගිවිසුම්වලට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරිම, එම කටයුතු නිසි පරිදි ඉටු වෙනවාද යන්න පරීක්ෂා කිරිම, එකී ගිවිසුම පරිදි වරින් වර ගෙවීම් කිරිම, එසේ ගෙවීමේදී ඒ ඒ නිළධාරින්ගේ සීමාව හා වගකීම්, ඒ වගේම භාවිතා කළ යුතු ලේඛන ආදී සියලු කරුණු මේ මුදල් රෙගුලාසිවල ඇතුලත් වෙනවා.

රජයේ නිලධාරින් ආධුනියකින් ලෙස බඳවාගෙන ඉහළට ගෙනියන්නේ දෙපාතර්මේන්තුවල ආරක්ෂාවටයි.

මේ නිසා තමයි රජයේ නිළධාරියෙකු මුල් අවස්ථාවේදී ආධුනික නිළධාරියෙකු වශයෙන් බඳවාගෙන ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබා දී ක්‍රම ක්‍රමයෙන් තනතුරෙන් අවශ්‍ය උසස්වීම් ලබා දී අමාත්‍යාංශයේ නිළධාරියෙකු දක්වා ඒ නිළධාරින් ඉදිරියට ගෙන යනු ලබන්නේ. එවිට අනිවායෙර්න්ම මුදල් අමාත්‍යාංශය වැනි ස්ථානයක කටයුතු කළ යුත්තේ දේශපාලන අතකොළුවක් නොව රජයේ මුදල් දෙවියන්ගේ හාල් යැයි තේරුම් ගත හැකි ඒ මුදල්වල වටිනාකම් හඳුනාගත හැකි සහ විශේෂයෙන්ම ඒ මුදල් භාවිතා කිරීමේදී භාවිතා කළ යුතු ක්‍රම පිළිබඳ සීමාවන් සහ අදාළ නීති රීති පිළිබඳ හසළ දැනුමක් ඇති පුද්ගලයෙකු විය යුතුය.

මේ රටේ මහජනයාගේ කරුමයට මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා ඇතුළු එවැනි ඉහළ තනතුරු දක්වා පත් කර ඇති බොහෝ නිලධාරීන් පත් කිරීමේදී සළකා බලා ඇත්තේ දේශපාලන හිතෛෂීභාවය පමණයි. ඒ ආකාරයටම තමයි වත්මන් මුදල් ලේකම්වරයාද පත් කර තිබෙන්නේ. මේ තනතුර හිස්වන විටම පාලරීමේන්තුවේ හිටපු ජාතික ලැයිස්තුවෙන් පත් වූ මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කළ NPP හිතවාදී ගැත්තෙකු මුදල් අමාත්‍යාංශයේ ලේකම් වැනි ඉහළ තනතුරකට පත් වන්නේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

මුදල් රෙගුලාසි අනුව ඕනෑම ගෙවීමක් කිරීමේදී ප්‍රධාන කරුණු තුනක් වැදගත් වේ.

1. බලය දීම.

2. අනුමත කිරිම.

3. සහතික කිරිම.

බලය දීම ගත් කළ මුදල් අමාත්‍යාංශය ඇතුලු අනෙකුත් අමාත්‍යාංශවලට අදාළ වෂර්ය සඳහා මුදල් වියදම් කිරිමට බලය දෙන්නේ පාලරීමේන්තුව විසින් අය වැය වාෂරීකව අනුමත කිරීම තුළිනි. එසේ අනුමත කළ පසු එහි සඳහන් ගෙවීම් හැර විවිධ හැකවර්රුන්ට මුදල් ගෙවීමට කිසිදු බලයක් නැත.

අනුමත කිරීම ගත් කළ ඒ අමාත්‍ය මණ්ඩලයට, ප්‍රධාන ගණන් නිලධාරී වශයෙන් ලේකම්වරයාට, ගණන් දීමේ නිලධාරියා වශයෙන් දෙපාතර්මේන්තුවේ ප්‍රධානියට සහ ආයතන ප්‍රධානියාට ඇතුළු ඉන් පහළ නිලධාරින්ට අනුමත කළ හැකි මුදල් සීමාවක් පැහැදිළිව නීති රීතිවල දක්වා තිබෙනවා.

ඊට අමතරව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් වාෂරීකව මුදල් රෙගුලාසි 135 (මු.රෙ. 135) යටතේ තම අමාත්‍යාංශයට අදාළව ගෙවීම් සිදු කිරීමේ දී පාලරීමේන්තුව විසින් ලබා දුන් සීමාවන් යටතේ බලය දීම, අනුමත කිරීම සහ සහතික කිරීම කළ යුත්තේ කුමන නිලධාරින්ද බව පැහැදිළිවම දක්වා තිබෙනවා. එවිට මුදල් ගෙවිය යුත්තේ ඒ ආකාරයෙනි. මෙය අප සකස් කළ ක්‍රමයකටත් වඩා සුද්දාගේ කාලයේ සිට පැවත එන ක්‍රමයකි.

රජයේ සෑම මුදල් ගෙවීමක්ම අවම වශයෙන් නිලධාරීන් 10 දෙනෙකුගේ නිරීක්ෂණයට ලක්වන අතර අවසානයේ අමාත්‍යවරයාගේත්, අමාත්‍ය මණ්ඩලෙයේත්, පාලරීමේන්තුවෙත් නිරීක්ෂණයට හසුවන පරිදි අංක 33 දරණ රාජ්‍ය ණය කළමනාකරණ පනත සකස් කර ඇත.

සාමාන්‍යයෙන් ඕනෑම ගෙවීමකට අදාළව අදාළ ආයතනය තුළ ලිපි ගොණුවක් තිබෙනවා. එම ලිපි ගොණුව පාලනය කරනු ලබන්නේ සහ එය තබාගනු ලබන්නේ එම විෂය භාර නිලධාරීවරයාය. එම නිලධාරියා අදාළ ආයතනය තුළ කළමනාකාරණ සේවයේ නිලධාරියෙකු හෝ සංවධර්න නිලධාරියෙකු විය හැකිය. එවිට ඕනෑම ගෙවීමක් කිරීම සඳහා සකස් කළ යුතු පොදු 135 වව්වරය නියමිත පරිදි සකස් කරන්නේ මෙම නිලධාරියා විසින්ය. එම නිලධාරියා එම වව්වරය පිටපත් දෙකකින් සකස් කරයි. අනතුරුව එම වව්වරය ඇතුලත් ලිපිගොණුව ඊළඟ නිලධාරියාට යවනු ලැබේ. එම නිලධාරියා ප්‍රධාන ලිපිකරු හෝ අංශභාර පරිපාලන නිලධාරී හෝ සහකාර අධ්‍යක්ෂකවරයා විය හැක. එවැනි වව්වරයක් ලැබූ විට එම නිලධාරියා අදාළ වව්වරය පරීක්ෂා කර ඊළඟ නිලධාරියාට ඉදිරිපත් කරයි. එම නිලධාරියා නියෝජ්‍ය අධ්‍යක්ෂ මට්ටමේ නිලධාරියෙකි. එම නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාද ලිපිගොණුව පරීක්ෂා කර තමාගේ ආසන්නතම ප්‍රධානියා වන අධ්‍යක්ෂකවරයාට ලිපි ගොණුව යවයි. එම අධ්‍යක්ෂවරයාද තමා වෙත ලැබුණු ලිපිගොණුව නිසි පරිදි

පරීක්ෂා කර අදාල දෙපාතර්මේන්තුවේ අතිරේඛ අධ්‍යාක්ෂක ජනරාල් වරයා වෙත යොමු කරයි. එම අතිරේඛ අධ්‍යාක්ෂක ජනරාල් වරයාද එය පරීක්ෂා කර තම නිදෙර්ශ සහිතව ලිපිගොණුව මුදල් අමාත්‍යංශයේ නම් තම විෂය භාර භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුයි. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා ද තම බලතල සීමාවන් යටතේ එය පරීක්ෂා කර බලා නිවැරදිතාවය තහවුරු කරගෙන මුදල් ලේකම්වරයා වෙත එය ඉදිරිපත් කළ යුතුය.

මෙම ප්‍රස්තුත කාරණයට අදාළ ගෙවීම කෝටි ගණනක ගෙවීමකි. ඊළඟට මෙම ගෙවීම කරනු ලබන්නේ ඕස්ට්‍රේලියාව වැනි අපට ඉතා වැදගත් රටක ආයතනයකටය. අනෙකුත් කාරණය මෙම ගෙවනු ලබන ණය අපගේ පෙර පැවති ආර්ථික තත්ත්වය අනුව සහන ණය යටතේ ලබා දී තිබූ ණය මුදල්ය. එතකොට එවැනි ප්‍රමාද වූ ගෙවීමක් ගෙවීම අදාළ අමාත්‍යංශයට, මුදල් අමාත්‍යංශයට වගේම රටේ කීතර්ිනාමයටත් ඉතා වැදගත්ය.

ඇත්තවශයෙන්ම එවැනි ගෙවීමක් කිරීම ඉතාමත් වැදගත්ය. මේ නිසා මුදල් ලේකම්වරයා තමාට ලිපි ගොණුව ලද විට තමාගේ නියෝජ්‍ය ඇමතිවරුන් මෙන්ම මුදල් අමාත්‍යවරයාද එම ගෙවීම කරනු ලබන බවට දැනුවත් කළ යුතුය. එයට විශේෂ හේතුව මෙම මුදල් කෝටි ගණනක ගෙවීමක් වීමත් එම ගෙවීම අදාළ වන්නේ අප වෙත සහන ලබා දී තිබූ ණය මුදල් ගෙවීමක් වීමත්, ඕස්ට්‍රේලියාව වැනි යහපත් විදේශ සම්බන්ධතාවක් පවතින ඉතා වැදගත් අප රටට බෙහෙවින් උදව් කරන රටකට කරන ගෙවීමක් නිසාත්ය.

එසේනම් මින් පැහැදිළි වන්නේ අදාළ ගෙවීම සම්බන්ධව ඉතා පැහැදිළිව එම විෂයභාර නිලධාරිවරයාගේ සිට අමාත්‍යංශයේ ලේකම්වරයා දක්වාත්, ඇමතිවරයා, අමාත්‍ය මණ්ඩලය සහ පාලර්මේන්තුවද දැනුවත් කිරීමට අංක 33 දරණ රාජ්‍ය ණය කළමනාකරණ පනතින් බැඳි සිටින බවය.

ඒ අනුව වැරදි ගෙවීමක් කළ පසු (වැඩේ වැරදුනාට පසු) අපි කවුරුත් මේක දන්නෙ නෑ, පල්ලෙහා නිලධාරින් තමයි මේක කරලා තියෙන්නෙ, අපි දැනටමත් නිලධාරින් කිහිප දෙනෙකුගේ වැඩ තහනම් කරලා තියෙනවා, අපි මේක දැනගෙන මාස හතරක්, පහක් වෙනවා, ඒ වුනාට අපි කාටවත් කිව්වේ නෑ මේ හැකවර්රු අල්ලගන්න බැරිවෙයි කියලා වැඩක් නැහැ. මේ සම්පූණර්යෙන්ම ආණඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කරලෙයි තිබෙන්නේ. හැකවර්රු නම් මේ හොර වැඩේ කලේ වැඩ තහනම් කරන්න ඕන හැකවර්රුන්ගේ, නමුත් තහනම් කර ඇත්තේ සුළු නිලධාරින්ගේයි.

ඒ වගේම ඉතා පැහැදිළි කරුණක් වන්නේ මේ පහළ නිලධාරින්ගේ පමණක් වැඩ තහනම් කිරීමෙන් පෙනී යන්නේ ඔවුන්ව බිල්ලට ලබා දී මුදල් ඇමතිවරයා, මුදල් ලේකම්වරයා ඇතුළු ඉහළ මට්ටමේ වගකිව යුතු නිලධාරින් පැන යාමට තැත් කරන බවයි.

ඒ වගේම මෙම කාරණය සෙවීම සඳහා මුදල් අමාත්‍යංශයේම තුන් හතර දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර ඇති බව වාතර්ා වෙනවා. එම කමිටුවේ සිටින්නේ එම වගකීම දරන පුද්ලයින්මයි. මේක ''හොරාගෙන්ම පේන අහනවා වගේ'' වැඩක්. ඒ වැඩෙත් මේ ආණ්ඩුව විසින් පෙර සිදු කරන ලද විකාරරූපී වැඩ වගේම එකක්.

මෙය ජාත්‍යන්තර වශයෙන් රටට කරන අපහාසයක්.

ඒ නිසා අපි රජයට බල කර සිටින්නේ මේ සම්බන්ධයෙන් වගකීම දරන සියලු අය ඉල්ලා අස්විය යුතු බවයි. ඒ වගේම නිලධාරින් කිසිදු පරීක්ෂණ මණ්ඩලයකට පත් නොකර ස්වාධීන ව්‍යවහාරික විගණන මණ්ඩලයක්

මගින් මෙය වහාම විගණනය කර යතා තත්ත්වය ජනතාවට පැහැදිළි කළ යුතුයි. එයට හේතුව වන්නේ මුදල් අමාත්‍යංශය වැනි අමාත්‍යංශයක මුදල් මෙවැනි ආකරයට සොරකම් කිරීම හෝ අස්ථානගතවීම මුළු රටටත්, ජාතියටත් කරනු ලබන අපහාසයක් වන බැවින්ය. එය ජාත්‍යන්තර වශයෙන් අපේ රටට සිදු වූ මහා අපහාසයකි. මින් ඉදිරියේදී කිසිදු රටකින් අපිට ණය මුදල් ලබා වෙන එකක් නැහැ. මෙය ඉතා බරපතල තත්ත්වයක්.

මෙවැනි අවස්ථාවක වහාම කළ යුත්තේ මුදල් ලේකම්වරයා සහ අදාළ අමාත්‍යවරුන් වහාම අපරාධයක් සිදු වී ඇති බවට ගණන් බලා එයට සම්බන්ධ සියලු දෙනාට විරුද්ධව ක්‍රියා කිරීමයි.

එසේම පහත කාරණා දෙක ඉතා වැදගත් වේ.

1. මුදල් රෙගුලාසිවලට අනුකූලව ප්‍රධාන ගණන් නිලධාරියාගේ වගකීමක් ලෙස දක්වා ඇත්තේ තම අමාත්‍යංශයේ කිසියම් මුදලක් අස්ථානගත වී ඇත්නම් ඒ බව අමාත්‍යවරයාටත්, කැබිනට් මණ්ඩලයත්, මුදල් වගකීම ඇත්තේ පාලරීමේන්තුවට නිසා පාලරීමේන්තුවත් දැනුවත් කිරීමයි.

2. තවත් වැදගත් කාරණයක් වන්නේ, මෙම මුදල ගෙවීම සඳහා පාලරීමේන්තුවේ අනුමැතිය ලබා දී ඇත්තේ, මෙම වෂර්යේ අය වැය ලේඛනය මගින්ය. දැන් එම මුදල ගෙවා අවසන් කර ඇත. එය ගෙවා ඇත්තේ පිටස්තර පුද්ගලයෙකුටය. එසේනම් දැන් නියම ණය හිමියාට එම මුදල ගෙවිය යුතුය. එසේ ගෙවීමට නම් ඇප්‍රොපියේෂන් බිල් (Appropriation Bill) පතක් මගින් අදාළ මුදල ගෙවීම සඳහා පාලරීමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය.

ඒ නිසා තමයි viii වැනි විධායක ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා කිව්වේ ‘‘L’’ බෝඩ් අයට රට බාර දෙන්න එපා කියලා.

මෙම අමාත්‍යංශ පමණක් නොව මුළු රටම මෙවැනි පළපුරුද්ද,ක් කළපුරුද්දක් නොමැතිකම නිසාත් උද්දච්චකමින් කටයුතු කිරීමට යාම නිසාත්, රට පිස්සන් කොටුවක් වී ඇත. එසේම ‘‘මහජනයාට අබසරණ’’ තත්වයක් ඇති වී තිබෙන බවනම් පැහැදිලිය.

කෙසේ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවත්, රාජ්‍ය ණය කළමනාකරණ පනත නොහොත් (Public Debt Management) පනත අනුවත් මේ කටයුතු සිදු කළාද යන්න විභාග කිරීම වැදගත් වෙනවා. මෙය සොයා බැලීම සඳහා ව්‍යවහාරික මූල්‍ය ආයතනයකට පැවරීම තමයි වඩාත් යෝග්‍ය වන්නේ. එසේ නොමැතිව වරද සිදුකළ අයගෙන්ම වරද සඳහා පරීක්ෂණ කිරීමෙන් අහිංසක කුඩා නිලධාරීන්ට මේ වරදට වරදකරුවන් වීමට සිදුවේවී.

එම පනත අනුව, ණය ගෙවීම්, ණය ගැනීම්, ණය ප්‍රදශර්නය කිරීම, ප්‍රසිද්ධ කිරීම කළ යුතු බව පනතේම සඳහන් කර තිබෙනවා. එවැනි තත්ත්වයක් තිබියදී ඉතාමත් අවාසනාවන්ත විදිහට මේ සිදුකරන ලද කතර්ව්‍යය හරහා සිදුවී ඇත්තේ ශ්‍රී ලංකාවේ මහා භාණ්ඩාගාරය වෙනත් අයෙකු රෑ හොරෙන් අරගෙන ගියා කියලා කිව්වත් පුදුමයට කාරණයක් නොවේ.

2022 රට බංකොලොත් වී තිබුණු අවස්ථාවේදී පවා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා මුදල් ඇමති ලෙස බංගලාදේශයටත්, තවත් රටවල් කිහිපයකටත් අපට ණය ගෙවීමට හැකි බව ලොවට පෙන්වීම සඳහා ණය

ගෙවීම් සිදුකළා. ඒ අවස්ථාවේදී රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒ බව කැබිනට් මණ්ඩලයත්, පාලර්මේන්තුවත් දැනුවත් කිරිමට පියවර ගත්තා.

2026 IMF ෂී වාතර්ාවට අනුව මෙය ශ්‍රී ලංකාවට බලපාන්නේ මෙසේයි.

ශ්‍රී ලංකාවට මෙය විශේෂයෙන් බලපානේනේ කෙසේද?

NDB වංචාව - රුපියල් බිලියන 13.2ක්, අභ්‍යන්තර රැකියාව, අනාවරණය නොවූ අරමුදල් රටින් පිටතට ගෙන යාම.

මුදල් අමාත්‍යාංශයේ හැක් කිරීම - ඕස්ට්‍රේලියාවට ගෙවිය යුතු ඩොලර් මිලියන 2.5 ක ස්වෛරී ණය ගෙවීම හරවා යවා ඇත.

2023 වසරේදී IMF අනතුරු ඇඟවීම - CBSL බැංකු අධීක්ෂණය බරපතල ලෙස දුවර්ල බව සලකුණු කර ඇත

කොළඹ IMF මෙහෙයුම - වචනාථර්යෙන් තිබූ NDB වංචාව අප්‍රේල් මාසයේදී හෙළි වූ විට අපකීතර්යට පත්විය.

ශ්‍රී ලංකාව යනු IMF ක්‍රියාකාරී පත්‍රිකාව විස්තර කරන ආකාරයට නිශ්චිත අවදානම් පැතිකඩ පිළිබඳ පෙළපොත් සිද්ධියකි. මධ්‍යම ප්‍රමාණයේ නැගී එන වෙළඳපොළ බැංකුවක්, දුවර්ල අධීක්ෂණ රාමුවක්, දේශසීමා අරමුදල් චලනය, බණ්ඩනය වූ අනාවරණය. CBSL විසින් නියෝග කරන ලද වෝහාරික විගණනය අත්‍යවශ්‍ය පළමු පියවරකි, නමුත් 2023 සිට IMF විසින් සලකුණු කර ඇති ව්‍යුහාත්මක පාලන හිඩැස් සැබෑ ගැටළුවයි. ඒවා නිවැරදි කරන තුරු, EFF වැඩසටහන් කොන්දේසි දැඩි වනු ඇත.

මෙන්න මේ නිසා තමයි රනිල් වික්‍රමසිංහ VIII වැනි විධායක ජනාධිපතිතුමා, “L“ බෝඩ් එකක් පෙන්වලා කිව්වේ L බෝඩ් අය පත් කරන්න එපා, එසේ කළොත් රට වැනසෙයි' කියලා. කොහොම නමුත් දැන් එය සිදුවී හමාරයි.

වජිර අබේවර්ධන (හිටපු අමාත්‍ය)

සභාපති - එක්සත් ජාතික පක්ෂය.

මෙම ප්‍රශ්න සඳහා රජය වහාම පිළිතුරු සැපයිය යුතුය.

විදේශ ණය ගෙවීමක් කළ විට 2024 අංක 33 දරණ රාජ්‍ය ණය කළමනාකරණ පනත (P.D.M.) අනුව ණය ගැනීමේ හෝ ගෙවීමේ කටයුතු සිදු කර තිබේද ?

"ණය ගෙවීම/ ණය ගැනීම 2024/33 දරණ රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 11 වෙනි වගන්තියේ (5) අනුව සියළු තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඉන්පසු එය මුදල් අමාත්‍යාංශයේ සහ කායර්ාලයේ නිල වෙබ් අඩවිවල පල කරනු ලැබිය යුතුය." (උපුටා ගැනිමකි)

එසේ පනතේ සඳහන් කාරණය අනුව මේ ණය ගෙවීම් අදාල නිල වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර තිබේද ?

මේ රජය සියළු දේශපාලන වාසි ලබාගන්නා අතර පිටරට ණය ගෙවීම ගැන මහජනතාව සහ කැබිනට් මණ්ඩලය දැනුවත් කර තිබේද ?

ඕස්ට්‍රේලියාවෙන් ලබා ගත් මුදල් කුමන බැංකුවක් හරහා ගෙවා තිබේද ? එම බැංකුවේ නම සහ ගිණුම් අංකය ප්‍රසිද්ධ කරන්නේද?

එම මුදල් ගෙවා ඇත්තේ කුමන රටක බැංකුවටද ? බැංකුවේ නම සහ රටේ නමත් ගිණුම් අංකයත්ප්‍රසිද්ධ කරන්න?

අදාළ මුදල් ගෙවූ දිනය, මුදල් ගෙවූ අවස්ථා ගණන, මහ බැංකුව විසින් ඔවුන්ගේ නිවේදනය අනුව 2026 ජනවාරි 01 න් පසු ක්‍රියාත්මක වන ක්‍රියාවලිය සහ ඊට ප්‍රථම ක්‍රියා කර ඇත්නම් ඒ කුමන පදනම යටතේ ද ?

මෙම ඕස්ට්‍රේලියානු ණය ගෙවා එය රජය විසින් ප්‍රසිද්ධ නොකර සිටියේ අංක 33 දරණ රාජ්‍ය ණය කළමණාකරන පනත උල්ලංඝනය කර ඇති නිසාද?

ඉහත සඳහන් තොරතුරු ප්‍රසිද්ධ කිරීමෙන් පෞද්ගලික මට්ටමේ දෙස් විදෙස් විශේෂඥයන් මේ ගැන සොයා දීමට රජයට සහාය වනු ඇත.

“ඉහත සඳහන් ප්‍රශ්නාවලියට රජය විසින් වහා පිළිතුරු සැපයිය යුතු අතර එම තොරතුරු සමස්ත මහජනතාවගේ දැන ගැනීමට සැළැස්විය යුතුය.”